කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි , 'වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන්නන්" ලෙසින් හැඳින්වීමෙන් වලකින' ලෙසින් සඳහන් වේ. මෙම නිර්දේශ පැනවී ඇත්තේ, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට තිබෙන හැකියාව අවම කිරීමට සහ ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීමටයි.

කෙසේ නමුත් මෙම නිර්දේශයන් මාධ්‍ය මගින් පිළිනොපදින අවස්ථාවන් අපි නිරීක්ෂණය කරමු. "මල්වාන ප්‍රදේශයේ බ්‍රැන්ඩික්ස් සේවිකාවක් නිසා 59 දෙනෙක් නිරෝධායනය වී අවසන්" යනුවෙන් මව්බිම පුවත්පතේ (10/23) දැක්වෙන සිරස්තලය ඊට නිදසුනකි.

මෙවැනි ආචාර ධාර්මික නොවන ආකාරයෙන් කොවිඩ්-19 පිළිබඳ පුවත් වාර්තා කිරීම ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනයට ලක් කරන්නන් සමාජයේ කොන් කිරීමකට ලක් වීමත්, එය කොවිඩ්-19 මර්දන කටයුතු වෙතද බලපෑම් එල්ල කිරීමත් බව අවධාරණය කළ යුතු වේ. එනිසා, ආචාර ධාර්මික මාධ්‍යකරණයක් පවත්වා ගැනීමට උත්සුක වීම මාධ්‍ය අත රැඳි සමාජ වගකීමක් බවද යළි යළිත් සිහිපත් කිරීමට සිදුවේ.

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus # Mawbima**